# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1985 අංක 6 දරන ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරන ආයතන පනත

---

[සහතිකය සටහන් කළේ 1985 ජනවාරි මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 ජනවාරි මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.20 යි　　　　තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1985 අංක 6 දරන ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන පනත

[සහතිකය සටහන් කළේ 1985 ජනවාරි මස 09 වන දින.]

එල්. ඩී.—ඕ. 19/84

**ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය පිහිටුවීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද වූ පනතකි.**

පූර්විකාව.

ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය පිහිටුවීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන ආධාර කණ්ඩායම වෙනුවෙන් ක්‍රියා කරන ෆෝඩ් පදනම අතර එකඟවීමකට එළඹෙන ලද හෙයින් ද:

ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් අනුමත කරනු ලැබ ඇති එම ආයතනයේ වාටර්පත්‍රය අනුව එම ආයතනය විසින් ශ්‍රී ලංකාව තුළ සඵල ලෙස ක්‍රියාකාරී විය හැකි වීම පිණිස ව්‍යවස්ථා ප්‍රති පාදනය කිරීම අවශ්‍ය හා සුදුසුව ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 1985 අංක 6 දරන ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් ඉඩම් හා ඉඩම් සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය පිහිටුවීම

ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය පිහිටුවීම.

2. ජාත්‍යන්තර ස්වභාවයක වූ ස්වෙච්ඡා සංවිධානයක් වශයෙන් ක්‍රියා කරන (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය යනුවෙන් හැඳින්වෙන ආයතනයක්, මේ පනතේ විධිවිධානවලට අනුකූලව පිහිටුවනු ලැබිය යුතු ය.

ආයතනය සංස්ථාවක් විය යුතු බව.

3. ආයතනය, 2 වන වගන්තියෙන් ඊට පවරා ඇති නාමයෙන් යුක්ත අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර එහි සංස්ථා නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව නඩු පැවරිය හැකි ය.

ආයතනයේ මූලස්ථානය, ප්‍රධාන කාර්යාලය, නියෝජ්‍යායතන, කාර්යාල ආදිය.

4. (1) ආයතනයේ මූලස්ථානය හා ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ දිගන හෝ ආණ්ඩුව සහ ආයතනය විසින් අන්‍යොන්‍ය වශයෙන් එකඟවන පරිදි ශ්‍රී ලංකාව තුළ වෙනත් ස්ථානයක හෝ පිහිටුවිය යුතු ය.

(2) ආණ්ඩුවේ එකඟත්වය ඇතිව ආයතනය විසින්, කලින් කල ආයතනය විසින් අවශ්‍ය යයි අදහස් කරනු ලබන ශ්‍රී ලංකාවේ ස්ථාන වල වෙනත් කාර්යාල, නියෝජ්‍යායතන සහ ක්ෂෙත්‍ර ක්‍රියාකාරිත්ව ස්ථාන පිහිටුවනු ලැබිය හැකි ය.

(3) පිහිටුවනු ලබන ශාඛා කාර්යාල, නියෝජ්‍යායතන, සහයෝගිතා මධ්‍යස්ථාන හෝ ක්ෂෙත්‍ර ක්‍රියාකාරිත්ව ස්ථාන නිසා ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ආධාර වන ප්‍රමාණය සැලකිල්ලට

ජ 080202—6,825 (84/11)

ගෙන ආයතනය විසින් කලින් කල තීරණය කරනු ලබන වෙනත් රටවල, ඒ ශාඛා කාර්යාල, නියෝජ්‍යායතන, සහයෝගිතා මධ්‍යස්ථාන සහ ක්ෂේත්‍ර ක්‍රියාකාරිත්ව ස්ථාන ආයතනය විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

ආයතනයේ අරමුණු.

5. ආයතනය පිහිටුවනු ලබන්නේ යම් අරමුණු සඳහා ද ඒ අරමුණු මූලික වශයෙන් වාරිමාර්ග ක්‍රමවල කළමනාකරණය සහ ක්‍රියාකාරිත්වය දියුණු කිරීම උදෙසා විය යුතු අතර විශේෂයෙන් පහත සඳහන් කාර්ය සඳහා ක්‍රම, උපක්‍රම, ක්‍රියා පටිපාටි, ව්‍යවහාර ක්‍රම සහ ක්‍රියාකාරී විසඳුම් මාර්ග වර්ධනය කිරීම උදෙසා විය යුතු ය :—

(අ) කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා ජල භාවිතයේ ඵලදායීතාවය උපරිම තත්ත්වයට පත් කිරීම ;

(ආ) වාරිමාර්ග ක්‍රමයේ ඵල ප්‍රයෝජන බෙදීයාමේ විශ්වසනීයත්වය සහ සාධාරණත්වය සුරක්ෂිත කිරීම ;

(ඇ) වාරිමාර්ග ක්‍රමවල කළමනාකරණය සහ ක්‍රියාකාරිත්වය අගැයීම හා දියුණු කිරීම ;

(ඈ) වාරිමාර්ග ක්‍රමවල බලපෑමට යටත්වන ප්‍රදේශවල ජල සම්පාදිත පසෙහි හා පරිසරයෙහි ගුණාත්මක තත්ත්වයද එමෙන්ම ග්‍රාමීය කෘෂිකාර්මික ජන සමූහවල සෞඛ්‍යය, සාමාන්‍ය ශුභ සිද්ධිය සහ ජීවන තත්ත්වය ද ආරක්ෂා කර ගැනීම, පවත්වාගෙන යෑම සහ දියුණු කිරීම ; සහ

(ඉ) ජල සම්පාදනයේ විශ්වසනීයතාවය දියුණු කර එමගින් අස්වැන්න වැඩිකෙරෙන ආවිෂ්ට මත වූ ආයෝජන අවදානම අඩු කිරීම සහ

ඒ සම්බන්ධයෙන් වූ තොරතුරු වාරිමාර්ගවලට සම්බන්ධතාවක් දක්වන සම්භාවි භාවිත කරන්නන්ගේ කණ්ඩායම්, සංවිධාන සහ වෙනත් පුද්ගල මණ්ඩල හා තැනැත්තන් අතර බෙදා ගැනීම හා පැතිරවීම.

ආයතනයේ කාර්ය සහ කර්තව්‍ය.

6. ස්වකීය අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය යයි සාධාරණ ලෙස අදහස් කරනු ලබන පහත දැක්වෙන කාර්ය හා කර්තව්‍ය සියල්ලම හෝ ඉන් යමක් ආයතනය විසින් ඉටු කළ යුතු ය :—

(අ) වාරිමාර්ග ක්‍රමවල සැලැස්ම, නිර්මාණය, ක්‍රියාකාරිත්වය, ජලය ගලායාම සහ බෙදාහැරීම විධිමත් කිරීම, ජලය සඳහා මිල නියම කිරීම හා ප්‍රතිපත්ති, පස, පරිසරය සහ අදාළ ජනතාවගේ සෞඛ්‍ය සහ පොදු ශුභ සිද්ධිය කෙරෙහි බලපෑම ඇතුළුව වාරිමාර්ග ක්‍රමවල ක්‍රියාකාරිත්වයේ සහ කළමනාකරණයේ සියලු අවස්ථා අධ්‍යයනය කිරීම සහ අගැයීම ;

(ආ) වාරිමාර්ග ක්‍රමවල කාර්යක්ෂමතාවය, විශ්වසනීයතාවය සහ බෙදාහැරීමේ සාධාරණතාවය ඇතුලුව වාරිමාර්ග ක්‍රමවල කළමනාකරණය සහ ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කිරීමේ, විශ්ලේෂණය කිරීමේ සහ අගැයීමේ දියුණු ක්‍රම වර්ධනය කිරීම ;

(ඇ) ජලභාවිතය උපරිම තත්ත්වයට ගෙන ඒමට ඇති සංරෝධ දුරලීම සහ වැඩිදියුණු කළ කළමනාකරණය සහ ක්‍රියාකාරිත්වය සඳහා දිරිගැන්වීම් සැපයීම ඇතුළුව වාරිමාර්ග ක්‍රමවල සහ ජලභාවිතයේ ඵලදායිතාවයේ ඌනතාවන් සොයාගැනීම සහ ඒවා නිවැරදි කිරීම ;

(ඈ) වාරිමාර්ග ක්‍රමවල අඩුපාඩුකම්වලට ප්‍රතිකර්ම යෙදීමේ හෝ ජලභාවිතය උපරිම තත්ත්වයට ගෙන ඒමට ඇති සංරෝධ දුරලීමේ කාර්ය සඳහා වාරිමාර්ග ක්‍රමවල කටයුතුවලට මැදිහත්වීමේ ක්‍රම සලසා ගැනීම සහ ඒ මැදිහත්වීම්වල ප්‍රතිඵල අධීක්ෂණය කිරීම සහ අගැයීම ;

(ඉ) පස, පරිසරය සහ අදාළ ජනතාවගේ සෞඛ්‍ය සහ පොදු සුභසාධනය කෙරෙහි ඒ මැදිහත්වීම්වල බලපෑම අධ්‍යයනය කිරීම, විශ්ලේෂණය කිරීම සහ අගැයීම ;

(ඊ) ඒ අධ්‍යයනවල හා ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල එකතු කිරීම, විශ්ලේෂණය කිරීම, පළ කිරීම සහ බෙදා දීම ;

(උ) ආයතනයේ අධ්‍යයන සහ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ දත්ත බැංකුවක් පවත්වාගෙන යාම සහ පොදුවේ වාරි මාර්ග ක්‍රම පිළිබඳව සහ ආයතනයේ අරමුණු සහ ක්‍රියාකාරකම්වලට අදාළ වෙනත් සියලු කාරණා පිළිබඳව තොරතුරු සපයන තොරතුරු මධ්‍යස්ථානයක්, පුස්තකාලයක් සහ දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඌ) වාරිමාර්ග ක්‍රම අධ්‍යයනය කිරීමේ, අගැයීමේ, විශ්ලේෂණය කිරීමේ, සැලසුම් කිරීමේ, ඉදි කිරීමේ, සංවර්ධනය කිරීමේ හෝ ක්‍රියාකරවීමේ යම් අංශයක හෝ ඊට සම්බන්ධ යම් පර්යේෂණ, අධ්‍යාපනික, තොරතුරු හෝ ක්‍රියාකාරී වැඩ සටහනක යෙදී සිටින හෝ යෙදීමට සිටින තැනැත්තන් පුහුණු කිරීම.

(එ) ආයතනයේ අරමුණු සහ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ හෝ ඊට අදාළ වැඩවල යෙදී සිටින තැනැත්තන් සඳහා ද ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ අගැයීම සඳහා ද ආයතනයේ වැඩවලට අදාළ තොරතුරු හුවමාරුව සඳහා ද සාකච්ඡා, සම්මන්ත්‍රණ, මංඩප, උපදේශක හමුවීම්, වැඩමුළු සහ රැස්වීම් සංවිධානය කිරීම සහ පැවැත්වීම ;

(ඒ) ආයතනයේ වැඩ, රටවල්, සංවිධාන, සහයෝගිතා මධ්‍යස්ථාන සහ වෙනත් ආයතන සහ මණ්ඩල විසින් උපරිම තත්ත්වයෙන් ප්‍රයෝජනයට ගැනීම හා යොදා ගැනීම සඳහා ආයතනික හෝ වෙනත් වැඩ පිළිවෙළවල් ශක්තිමත් කිරීම, වෙනස් කිරීම හෝ දියුණු කිරීම සහ රටවල්වලට, සංවිධානවලට, සහයෝගිතා මධ්‍යස්ථානවලට සහ වෙනත් ආයතන් සහ මණ්ඩලවලට තොරතුරු සහ උපදෙස් සැපයීම ; සහ

(ඔ) ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ ප්‍රයෝජනවත් හෝ හිතකර වේයැයි ආයතනය විසින් අදහස් කරනු ලබන වෙනත් කටයුතු.

ආයතනයේ බලතල.

7. ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීමෙහි ලා අවශ්‍ය වන සියලු බලතල ආයතනයට තිබිය යුතු ය. විශේෂයෙන් පහත සඳහන් දේ ආයතනය විසින් කළ හැකි ය :—

(අ) ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා අවශ්‍ය හෝ ප්‍රයෝජනවත් හෝ හිතකර විය හැකි චාටර්පත්‍ර, සුවිශේෂ අධිකාර, බලපත්‍ර, වරප්‍රසාද, පහසුකම්, ආධාර, අරමුදල් සහ නිශ්චල හෝ චංචල දේපළ හෝ එහි අයිතිවාසිකම් සහ වෙනත් අයිතිවාසිකම් සහ වත්කම් යම් ආණ්ඩුවකින්, ජාත්‍යන්තර සංවිධානයකින් හෝ යම් නියෝජ්‍යායතනය කින්, ශාඛා ආයතනයකින් හෝ එහි යම් දේශපාලන අතුරු ඒකකයකින් හෝ යම් තැනැත්තකුගෙන්, පුද්ගල මණ්ඩලයකින්, සංස්ථාවකින් හෝ වෙනත් නෛතික ඒකකයකින්, (ප්‍රදානයක්, ත්‍යාගයක්, මිල දී ගැනීමක්, හුවමාරුවක්, බදුදීමක්, පවරාදීමක්, රික්තවරණයක් වශයෙන් හෝ වෙනත් ආකාරයකින් නියත වශයෙන් ම හෝ භාරයක් වශයෙන්) අත්කර ගැනීම, ලබාගැනීම හෝ භාර ගැනීම ;

(ආ) ආයතනයේ නිශ්චල හා චංචල දේපළ, අරමුදල්, අයිතිවාසිකම් සහ වත්කම් අත්කර ගැනීම, දැරීම, අයිතිව සිටීම, ප්‍රයෝජනයට ගැනීම, ක්‍රියාත්මක කිරීම, බදුදීම හෝ වෙනත් ක්‍රමයකින් බැහැර කිරීම ;

(ඇ) ආයතනයේ අරමුදල් ආයෝජනය කිරීම, බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීම, මුදල් ණයට ගැනීම, ණය ලබා ගැනීම, ණයගැතිභාවය පිළිබඳ සාක්ෂි නිකුත් කිරීම සහ ආයතනයේ ණය හා බැඳීම් සඳහා ඇප වශයෙන් ආයතනයේ යම් දේපළක්, අයිතිවාසිකම් හෝ වත්කම් උකස් කිරීම, ඔඩපනය කිරීම හෝ එහි යම් අයිතිවාසිකම් ප්‍රදානය කිරීම ;

(ඈ) ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ ප්‍රයෝජනවත් හෝ හිතකර විය හැකි සියලු ගොඩනැගිලි, ඉදිකිරීම්, පිරියත්, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ පහසුකම් ඉදිකිරීම, මිල දී ගැනීම, සවිකිරීම සහ ලබා ගැනීම ;

(ඉ) ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ ප්‍රයෝජනවත් හෝ හිතකර විය හැකි නිලධරයන්, උපදේශකවරුන්, සේවකයන් සහ අනුයෝජිතයන් පත් කිරීම, සේවයේ නියුක්ත කර ගැනීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන් විෂය යෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ඊ) ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ ප්‍රයෝජනවත් හෝ හිතකර විය හැකි සියලු ගිවිසුම්වලට සහ එකඟවීම්වලට, කෙලින්ම හෝ ආයතනය විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින්, එළඹීම, ඒවා ඉටු කිරීම සහ ක්‍රියාවේ යෙදවීම ;

(උ) ආයතනය සමග සහයෝගිව ක්‍රියා කරන ආයතනවල, නියෝජ්‍යායතනවල සහ මධ්‍යස්ථානවල කටයුතුවලට සහ වැඩ සටහන්වලට ආධාර වශයෙන් අරමුදල්, සැපයුම් සහ සේවා වන් සැලසීම ;

(ඌ) ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ ප්‍රයෝජනවත් හෝ හිතකර විය හැකි කාර්ය සඳහා, සත්කාරක රටවල සහ වෙනත් තැන්වල වූ සංවිධාන, ආයතන සහ නියෝජ්‍යායතන සමග සහයෝගිව සහ ඒකාබද්ධව කටයුතු කිරීම සඳහා සම්බන්ධතා සහ වැඩපිළිවෙළවල් ඇති කිරීම සහ සංවර්ධනය කිරීම ; සහ

(එ) ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රයෝජනවත් හෝ ආනුෂංගික හෝ හිතකර විය හැකි සියලු වෙනත් ක්‍රියා හා දේ කිරීම.

## II වන කොටස

## ආයතනයේ සංවිධානය හා කළමනාකරණය

8. ආයතනයට, දොළොස් දෙනකුට නොඅඩු සහ විසි දෙනකුට නොවැඩි සාමාජික සංඛ්‍යාවකින් යුක්ත (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලයක් තිබිය යුතු අතර එම සාමාජිකයන්ගෙන්— *ආයතනයේ පාලක මණ්ඩලය.*

(අ) යටත් පිරිසෙයින් එක් සාමාජිකයකුවත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් පත් කරනු ලැබිය යුතු ය. ඔහු වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව, ජලසම්පාදිත කෘෂිකර්මය සහ කළමනාකරණ විද්‍යාව යන ක්ෂේත්‍රවල වෘත්තිය සුදුසුකම්, පළපුරුද්ද හෝ උනන්දුව ඇති තැනැත්තකු විය යුතු ය ; තවද

(ආ) එක් සාමාජිකයකු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ධුරය තත් කාලයේ දරන තැනැත්තා විය යුතු අතර ඔහු නිල බලයෙන් සාමාජිකයකු විය යුතු ය.

9. (මෙහි මින්මතු "පළමුවන මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළමුවන පාලක මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :— *ආයතනයේ පළමුවන පාලක මණ්ඩලය.*

(අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් පත් කරනු ලබන එක් සාමාජිකයකු ;

(ආ) 22 වන වගන්තිය යටතේ පත් කරන ලද්දා වූ ද නිල බලයෙන් පත් වූ සාමාජිකයකු විය යුතු වූ ද ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ; සහ

(ඇ) ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරන ආයතන ආධාර කණ්ඩායම විසින් පත් කරනු ලැබිය හැකි වෙනත් සාමාජිකයන්. මෙයින්—

(i) තුනෙන් එක් පංගුවක් අවුරුදු දෙකක කාලයක් ධුර දැරීම සඳහා පත් කරනු ලැබිය යුතු ය ;

(ii) තුනෙන් එක් පංගුවක් අවුරුදු තුනක කාලයක් ධුර දැරීම සඳහා පත් කරනු ලැබිය යුතු ය ; සහ

(iii) තුනෙන් එක් පංගුවක් අවුරුදු හතරක කාලයක් ධුර දැරීම සඳහා පත් කරනු ලැබිය යුතු ය.

**මණ්ඩලය විසින් සාමාජිකයන් පත් කිරීම.**

10. ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන ආධාර කණ්ඩායම විසින් පත් කරන ලද යම් සාමාජිකයකුගේ ධුර කාලය අවසන් වූ විට, මණ්ඩලය විසින්, 12 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ඒ සාමාජිකයා නැවත පත් කිරීම හෝ වෙනත් තැනැත්තකු පත් කිරීම කළ හැකි ය.

**අතිරේක සාමාජිකයන් පත් කිරීම.**

11. මණ්ඩලය විසින්, යම් අවස්ථාවක, 12 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකු මණ්ඩලයේ අතිරේක සාමාජිකයකු වශයෙන් පත් කළ හැකි ය:

එසේ වුවද යම් අවස්ථාවක මුළු සාමාජික සංඛ්‍යාව 8 වන වගන්තිය යටතේ නිශ්චිත උපරිම සංඛ්‍යාව නො ඉක්මවිය යුතුය.

**සාමාජික සංඛ්‍යාව.**

12. 10 වන සහ 11 වන වගන්ති යටතේ මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීමේ දී මණ්ඩලය පහත දක්වෙන සීමා කිරීම් අනුගමනය කරන බවට වගබලාගත යුතු ය :—

(i) සාමාජිකයන් දෙදෙනකුට නො අඩු සහ තිදෙනකුට නො වැඩි ගණනක් සත්කාරක රටවල් විසින් නම් කළ තැනැත්තන් අතුරින් පත් කරනු ලැබිය යුතු ය ;

(ii) ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන ආධාර කණ්ඩායමේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකොටසක් විසින් නම් කරන ලද හෝ අනුමත කරන ලද තැනැත්තන් අතුරින් සාමාජිකයන් හතර දෙනකු ; සහ

(iii) වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව හා මෙහෙයවීම, ජලසම්පාදිත කෘෂිකර්මය, කළමනාකරණ සහ සමාජ විද්‍යා හා වෙනත් සම්බන්ධ ක්ෂේත්‍රවල වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හෝ උනන්දුවක් ඇති තැනැත්තන් අතුරින් පත් කරන ලද පස් දෙනකුට නො අඩු සාමාජික සංඛ්‍යාවක්.

**මණ්ඩලය විසින් පත් කරන ලද සාමාජිකයන් ඉල්ලා අස්වීම.**

13. මණ්ඩලය විසින් පත් කරන ලද යම් සාමාජිකයකු විසින් මණ්ඩලය වෙත යොමු කරන ලද ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

**සාමාජිකයන්ගේ ධුර කාලය.**

14. (1) මණ්ඩලය විසින් පත් කරනු ලබන සෑම සාමාජිකයකුම, මියයාම හෝ ඉල්ලා අස්වීම නිසා ධුරය හිස් කළහොත් මිස අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය. යම් අවස්ථාවක සාමාජික සංඛ්‍යාව වැඩි කළහොත් හෝ අඩු කළහොත්, හැකිතාක් ප්‍රමාණයට, මණ්ඩලය විසින් පත් කරන ලද සාමාජිකයන්ගෙන් තුනෙන් එක් පංගුවක් වාර්ෂිකව විශ්‍රාම යන බවට වගබලා ගැනීම සඳහා යම් අලුත් සාමාජිකයකුගේ ධුර කාලයේ සුදුසු වෙනස් කිරීමක් කළ යුතු ය.

(2) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පත් කරන ලද සාමාජිකයා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් තීරණය කරනු ලබන කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් කවර හෝ අවස්ථාවක නැවත පත් කිරීම හෝ ඉවත් කිරීම කළ හැකි ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂ ජනරාල් ධුරය දරන තාක් කල් පමණක් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ධුරය දැරිය යුතු ය.

විකල්ප සාමාජිකයා.

15. (1) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් පත් කරන ලද සාමාජිකයා වෙනුවට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් කවර හෝ වේලාවක විකල්ප සාමාජිකයකු පත් කළ හැකි ය.

(2) මණ්ඩලය විසින් පත් කරන ලද යම් සාමාජිකයකු වෙනුවට මණ්ඩලය විසින් කවර හෝ වේලාවක විකල්ප සාමාජිකයකු පත් කළ හැකි ය.

(3) ප්‍රධාන සාමාජිකයා පැමිණ නොමැති විටක දී පමණක් විකල්ප සාමාජිකයකු විසින් රැස්වීමට පැමිණ, සහභාගි වී එහි දී ඡන්දය පාවිච්චි කළ හැකි ය.

මණ්ඩලය විසින් පත් කරන ලද සාමාජිකයකු මියයාම හෝ ඉල්ලා අස්වීම.

16. මණ්ඩලය විසින් පත් කරන ලද සාමාජිකයකු, මියයාම නිසා හෝ ඉල්ලා අස්වීම නිසා ධුරය හිස්කළ අවස්ථාවක, ඒ සාමාජිකයාගේ නොගෙවී ඇති ධුර කාලය සඳහා ධුරය දැරීමට මණ්ඩලය විසින් වෙනත් තැනැත්තකු පත් කළ යුතු ය. ඒ සාමාජිකයාගේ විකල්ප සාමාජිකයකු වේ නම් ඔහු, එවැනි පත්වීමක් කරන තුරු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් කටයුතු කළ යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා.

17. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා හැර, මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් කෙනෙකු මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලයක් සඳහා මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් තෝරා පත් කරගත යුතු ය.

(2) සභාපතිවරයා හෝ ඔහු පැමිණ නැත් නම් මණ්ඩලය විසින් තෝරා පත් කරගත් වෙනත් සාමාජිකයකු මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු ය.

(3) එක හා සමාන ඡන්ද ගණනක් ලැබුනු අවස්ථාවක දී හැර, සභාපතිවරයාට හෝ ඒ වෙනත් සාමාජිකයාට ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම.

18. (1) සෑම ලිත් වර්ෂයකටම යටත් පිරිසෙයින් එක් වරක් වත් මණ්ඩලය රැස්විය යුතු ය.

(2) මණ්ඩලය විසින් ප්‍රකාශිතවම අන්‍යාකාරයෙන් තීරණය කළ හොත් මිස, මණ්ඩලයේ රැස්වීම්, ආයතනයේ මූලස්ථානයේ පැවැත්විය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට යටත්ව, රැස්වීමක දී වුවද මණ්ඩලය විසින් සාදන ලද රීති මගින් නිශ්චය කරන ලද කාර්ය පටිපාටිය අනුව වුවද මණ්ඩලයේ සියලු තීරණ සාමාන්‍ය බහුතරයේ මතය අනුව ගත යුතු ය.

සාමාජිකයකුගේ පුරප්පාඩුවක් හෝ සාමාජිකයකු පත් කිරීමෙහිලා වූ දෝෂයක හේතුවෙන් මණ්ඩලයේ ක්‍රියා හෝ කටයුතු අවලංගු නොවිය යුතු බව.

**19.** මණ්ඩලයේ සාමාජික ධුරවල යම් පුරප්පාඩුවක් තිබුනද ක්‍රියා කිරීමේ බලය මණ්ඩලයට තිබිය යුතු අතර එවැනි යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය; අවලංගු වූ සේ නොසැලකිය යුතු ය.

ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය මණ්ඩලය වෙත සතුවිය යුතු බව.

**20.** ආයතනයේ සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය මණ්ඩලය වෙත සතු විය යුතු ය.

මණ්ඩලය විසින් බලතල, කාර්ය හා කර්තව්‍ය පවරා දීම.

**21.** 10 වන සහ 22 වන වගන්තිවල නිශ්චිතව සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය හැර, පැවරීම අවශ්‍ය යයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන එහි බලතල, කාර්ය හා කර්තව්‍ය අතුරින් කිසිවක් මණ්ඩලය විසින් සභාපතිවරයාට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ 24 වන වගන්තියේ සඳහන් කමිටුවලට, මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව පැවරිය හැකි ය. එවැනි යම් පැවරීමක් කරනු ලැබුවද මණ්ඩලය විසින්ම එවැනි යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකි අතර මණ්ඩලය විසින් කවර හෝ අවස්ථාවක එවැනි යම් පැවරීමක් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

**22.** මේ පනතේ 20 වන වගන්තිය යටතේ මණ්ඩලය වෙත සතු වී ඇති බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අතිරේකව මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය:—

(i) ආයතනයේ ප්‍රතිපත්ති සකස් කිරීම;

(ii) ආයතනයේ ප්‍රධාන වැඩ සටහන් අනුමත කිරීම;

(iii) ආයතනයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ අගැයීම;

(iv) ආයතනයේ අයවැය ලේඛනය අනුමත කිරීම සහ ආයතනයේ මූදල් තත්ත්වය සමාලෝචනය කිරීම;

(v) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සහ උපදේශකවරු පත් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය;

(vi) ආයතනයේ සේවා නියුක්තයන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි ඇතුළුව පිරිස් පාලන සහ කාර්ය මණ්ඩල ප්‍රතිපත්ති අනුමත කිරීම සහ සමාලෝචනය කිරීම;

(vii) ආයතනයේ පරිපාලනය සහ මෙහෙයවීම් සඳහා අරමුදල් සපයා ගැනීම;

(viii) ආයතනයේ පරිපාලනය සහ මෙහෙයවීම්වලට, සහ මණ්ඩලයේ රැස්වීම්වල ගණපූරණය ඇතුළුව ඒ රැස්වීම්වලට අදාළ පරිපාලනමය හා කාර්ය පටිපාටිමය රීති සකස් කිරීම ; සහ

(ix) මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමිකය තීරණය කිරීම.

23. (1) මණ්ඩලය විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර ආයතනයේ පරිපාලනය, එහි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ මණ්ඩලයේ තීරණ ක්‍රියාවෙහි යෙදවීම සම්බන්ධයෙන් ඔහු මණ්ඩලයට වගකිව යුතු ය. ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයාට පවරනු ලබන බලතල, කාර්ය සහ කර්තව්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයාට අදාළව හැර, මණ්ඩලයේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මණ්ඩලයට උපදෙස් සහ නිර්දේශ සැපයිය යුතු ය.

(4) මරණය, ඉල්ලා අස්වීම, සේවයෙන් පහ කිරීම හෝ වෙනත් හේතුවක් නිසා අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරය හිස් කළහොත් හෝ අසනීප වීම, නොපැමිණ සිටීම, ධුරයෙන් අත්හිටුවීම හෝ වෙනත් හේතුවක් නිසා අධ්‍යක්ෂ ජනරාල්වරයාට ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ නොහැකි වුවහොත්, අවස්ථාවෝචිත පරිදි, අලුත් අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරන තෙක් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ධුරයේ කටයුතු නැවත භාරගන්නා තෙක්, ඒ ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා මණ්ඩලය විසින් වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කළ යුතු ය. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ධුරය දරන තැනැත්තකු වේ නම් ඔහු, වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලබන තෙක්, අධ්‍යක්ෂ ජනරාල් ධුරයේ වැඩ බැලිය යුතු ය.

24. බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන වෙනත් ස්ථාවර කමිටු හෝ තත් කාර්ය කමිටු මණ්ඩලය විසින් පත් කළ හැකි ය. ඒ කමිටුවලට මණ්ඩලයේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් විය හැකි ය. ස්ථාවර කමිටු හෝ තත් කාර්ය කමිටු පත් කිරීමට මණ්ඩලයට ඇති බලය.

25. ආයතනයේ මුද්‍රාව— ආයතනයේ මුද්‍රාව.

(අ) මණ්ඩලයේ සභාපතිවරයා භාරයේ තිබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් අනුමත කරනු ලබන මෝස්තරයක විය යුතු අතර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය ; තවද,

(ඈ) මණ්ඩලයේ අනුමතය ඇතිව හෝ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන රීතිවලට අනුකූලව හෝ හැර, යම් ලේඛනය කට නොතැබිය යුතු ය.

දේශපාලන කටයුතුවලට මැදිහත් නොවීම.

26. (1) ආයතනය, මණ්ඩලය, ආයතනයේ නිලධරයන් සහ කාර්ය මණ්ඩලය, නීති සම්පාදනයට බලපෑම් කිරීමට තැත් කිරීමෙන්, යම් අපේක්ෂකයකු වෙනුවෙන් වූ දේශපාලන ක්‍රියාවලියකට හෝ වෙනත් යම් ආකාරයක දේශපාලන කටයුත්තකට සහභාගි වීමෙන් සත්කාරක රටේ හෝ යම් රටක දේශපාලන කටයුතුවලට මැදිහත් නොවිය යුතු අතර සත්කාරක රටේ හෝ අදාළ රටවල හෝ දේශපාලන ස්වරූපයෙන් කිසි ලෙසකින් බලපෑමට ලක් නොවී අපක්ෂපාතිව ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(2) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී ආයතනයේ නිලධරයන් හා කාර්ය මණ්ඩලය ආයතනයට පමණක්ම වගකිව යුතු ය.

## III වන කොටස

## මුදල්

ආයතනයේ අරමුදල.

27. (1) ආයතනයට එහි අරමුදලක් තිබිය යුතු අතර, ආයතනය විසින් එය පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ අරමුදලට—

(i) ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන ආධාර කණ්ඩායම හෝ එහි සාමාජිකයන් විසින් සපයනු ලබන සියලුම මුදල් ;

(ii) ආයතනය විසින්, එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ලබන සියලුම මුදල් ; සහ

(iii) ආයතනය විසින්, ආදායම, ණය, ප්‍රදාන, ත්‍යාග මගින් හෝ එහි අයිතිවාසිකම් හා වත්කම් අතුරින් කිසිවක් විකිණීමෙන් ලබන සියලුම මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(3) ආයතනය විසින්, එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී දරන ලද වියදම් කිසිවක් ගෙවීම සඳහා අවශ්‍ය වන සියලුම මුදල්, මණ්ඩලය විසින් කලින් කල සාදනු ලබන රීතිවලට අනුකූලව, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) ආයතනයේ අරමුදල්, මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන පරිදි යම් ව්‍යවහාර මුදල්වලින් යම් රටවල තැබිය හැකි ය.

මුදල් වර්ෂය.

28. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

29. (1) ආයතනයේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට මණ්ඩලය විසින් සලස්වනු ලැබිය යුතු ය. ගිණුම් විගණනය.

(2) මණ්ඩලය විසින් පත්කරනු ලැබූ ස්වාධීන සනතික කළ හෝ වරලත් රාජ්‍ය ගණකාධිකාරිවරයකු විසින් ආයතනයේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) ඒ විගණකයන්ගේ පාරිශ්‍රමිකය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

30. (1) ආයතනයේ ගිණුම් පිළිබඳ විගණනය කරන ලද ප්‍රකාශයක් ඇතුලත් වාර්ෂික වාර්තාවක් ආයතනය විසින් පළ කරනු ලැබිය යුතු ය. පළකිරීම ආදිය.

(2) යෝග්‍ය යයි ආයතනය සලකන, එහි කටයුතු සහ වැඩසටහන් වලට අදාළ වෙනත් වාර්තා ද ආයතනය විසින් පළ කරනු ලැබිය හැකි ය.

31. ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන ආධාර කණ්ඩායමේ සාමාජිකයන් විසින් සලකා බැලීම සඳහා, ආයතනය විසින් සෑම වර්ෂයකම, පසුව එළඹෙන වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයක් ඒ සාමාජිකයන් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ආයතනයේ අයවැය ලේඛනය.

32. ආයතනයේ පැවිච්චිය සඳහා අවශ්‍ය යයි සලකන ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් ආණ්ඩුව විසින් සපයනු ලැබිය හැකි ය. ආයතනයේ පැවිච්චිය සඳහා ආණ්ඩුව විසින් ස්ථාන සපයනු ලැබිය හැකි බව.

33. වාරිමාර්ග කළමනාකරණ සම්බන්ධයෙන් පර්යේෂණ සහ පුහුණු කිරීම පිණිස ජාත්‍යන්තර ආයතනයක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව ද ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනයේ ආධාර කණ්ඩායම වෙනුවෙන් ක්‍රියා කරන ෆෝර්ඩ් පදනම ද අතර, ඇති කරගන්නා ලද 1983 සැප්තැම්බර් මස 01 දින අත්සන් කරන ලද ගිවිසුම් පත්‍රයෙන් ආයතනයට සහ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට, උදේශකවරයන්ට, නිලධරයන්ට හා සේවකයන්ට පිරිනැමීමට ආණ්ඩුව විසින් එකඟ වන ලද සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද සහ පරිහාර— ආයතනයේ අයිතිවාසිකම්, වරප්‍රසාද, පරිහාර සහ ආයතනය නිදහස් කිරීම.

(අ) ඒ ආයතනය වෙත;

(ආ) ඒ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, උපදේශකවරයන්, නිලධරයන් සහ සේවකයන් වෙත,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, පිරිනමනු ලබන බවට සහතික කිරීම පිණිස අවශ්‍ය සියලු පියවර ආණ්ඩුව විසින් ගනු ලැබිය යුතු ය.

34. ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන ආධාර කණ්ඩායමේ හෝ මණ්ඩලයේ කිසිම සාමාජිකයෙක්, ඒ සාමාජිකත්වයේ හේතුව නිසාම පමණක් ආයතනයේ ණය සහ බැඳීම් සම්බන්ධයෙන් වග නොකිව යුත්තේ ය. සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

ආයතනයේ කටයුතු ගණන් බේරා අවසන් කිරීම.

**35.** (1) (අ) පාලක මණ්ඩලය විසින්, නොපැමිණි අයද ඇතුළු මුළු සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් තුනකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවකින් සම්මත කරන ලද යෝජනා සම්මතයක් මගින්, යෝජිත යෝජනා සම්මතය සම්පූර්ණයෙන් දක්වෙන සති අටකට නොඅඩු දැනුම්දීමක් කෙරුණු රැස්වීමක දී ආයතනයේ අරමුණු සතුටුදායක තත්ත්වයකින් ඉටුවීමේ හෝ ආයතනය තවදුරටත් ඵලදායි ලෙස කටයුතු කරගෙන යාමට නොහැකිවීමේ හෝ හේතුව මත ආයතනයේ මෙහෙයවීම් හා කටයුතු අවසන් කිරීමට තීරණය කරනු ලැබිය හැකි ය.

(ආ) එවැනි යෝජනා සම්මතයක් සම්මත කරනු ලැබූ විට,—

(i) ආයතනයේ කටයුතු ක්‍රමවත් ලෙස ගණන් බේරා අවසන් කිරීමෙහි, වත්කම් ආරක්ෂා කිරීමෙහි හා මුදල් කර ගැනීමෙහි හා එහි බැඳීම් නිරවුල් කර ගැනීමෙහි ලා අවශ්‍ය වන්නා වූ හෝ ඊට ආනුෂංගික වන්නා වූ කටයුතු හැර, ආයතනයේ සියලුම කටයුතු හා මෙහෙයවීම් ආයතනය විසින් වහාම නතර කරනු ලැබිය යුතු ය, තව ද .

(ii) ශ්‍රී ලංකා ආණ්ඩුව (හෝ වෙනත් යම් සත්කාරක රටක්) විසින් සපයන ලද ඉඩම් සහ ගොඩනැගිලි මෙන්ම ඒවා පිළිබඳ යම් ස්ථාවර ප්‍රාග්ධන ස්වභාවයේ වැඩි දියුණු කිරීම් හා ඒවායෙහි ඇති සියලු අයිතිවාසිකම් හා සම්බන්ධතා, ආයතනයේ කටයුතු ක්‍රමවත් ලෙස ගණන් බේරා අවසන් කිරීමෙහි ලා අවශ්‍ය කාල සීමාව සඳහා වූ පදිංචිය හා පාවිච්චියට යටත්ව ශ්‍රී ලංකා ආණ්ඩුවට (හෝ එවැනි වෙනත් සත්කාරක රටකට) නැවත දිය යුතු ය.

(ඇ) ආයතනයේ කටයුතු ගණන් බේරා අවසන් කිරීම සම්පූර්ණ කරනු ලැබූ විට, (ඉහත ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් දේවල් නොවන) ආයතනයේ සියලුම වත්කම් හෝ ඒවා විකිණී මෙන් ලත් මුදල්, පාලක මණ්ඩලයේ යෝජනා සම්මතයක් මගින් පුණ්‍ය කටයුතු සඳහා පමණක් සංවිධානය වූ හා මෙහෙයවනු ලබන්නා වූ සංවිධානයක හෝ සංවිධානවල හෝ ඒවායේ ප්‍රයෝජනය පිණිස හෝ සඳහා පමණක්ම නියාදනය කරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ කටයුතු ගණන් බේරා අවසන් කරනු ලැබුව ද නැතහොත්, අන්‍යාකාර දෙයක් සිදු වුවද ආයතනයේ වත්කම්, ආදායම, ලාභ හෝ ශුද්ධ ඉපයීම්වල කිසිම කොටසක්, ආයතනයේ අරමුණු හෝ කටයුතුවලට අදාළව ආයතනයට කරන ලද සේවාවන් වෙනුවෙන් ගෙවනු ලබන යුක්ති සහගත වන්දියක් හෝ පාරිශ්‍රමිකයක් වශයෙන් හැර, ආයතනයේ යම් නිලධරයකුගේ, සේවා නියුක්තයකුගේ, අනුයෝජිතයකුගේ හෝ භාරකරුවකුගේ, මණ්ඩලයේ නිලධරයකුගේ හෝ වෙනත් තැනැත්තකුගේ ප්‍රතිලාභයට එක් නොකළ යුතු ය.

අර්ථ නිරූපණය.

**36.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"පුණ්‍ය කටයුතු" යන්නෙන්, අධ්‍යාපනය හෝ දැනීම දියුණු කිරීම නැතහොත් දුගීභාවය පිළිබඳ සහනයක් හා සම්බන්ධයෙන් මිනිස් සංහතියට ප්‍රයෝජනවත් කටයුතු අදහස් වේ ;

"සත්කාරක රට" යන්නෙන්, ශ්‍රී ලංකාව සහ ආයතනය විසින් එහි මූලස්ථානය සහ ප්‍රධාන කාර්යාලය, ශාඛාවක් හෝ සහයෝගිතා මධ්‍යස්ථානයක් පිහිටුවනු ලද වෙනත් යම් රටක් අදහස් වේ; තවද

"ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන ආධාර කණ්ඩායම" යන්නෙන්, මෙහි උපලේඛනයෙහි සඳහන්, 1983 මැයි මස 24 වන දින සිට මැයි මස 27 වන දින දක්වා පැරිස් නුවර දී රැස් වූ රටවල්වල සහ සංවිධානවල ආධාරයෙන් පිහිටුවනු ලද ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන ආධාර කණ්ඩායම අදහස් වේ.

## උපලේඛනය (36 වන වගන්තිය)

### ආරම්භක සාමාජිකත්වය (තාවකාලික)

#### ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන ආධාර කණ්ඩායම

1. බහු පාර්ශ්වික වශයෙන්, ද්විපාර්ශ්වික වශයෙන් හෝ ජාතික වශයෙන් මුදලින් හෝ ද්‍රව්‍යවලින් දායක වන්නෝ.

අගා ඛාන් පදනම

ආසියානු සංවර්ධන බැංකුව

ඕස්ට්‍රේලියාව

ප්‍රංශය

ෆෝඩ් පදනම

අයි. එෆ්. ඒ. ඩී.

නෙදර්ලන්තය

රොක්ෆෙලර් සහෝදර අරමුදල

රොක්ෆෙලර් පදනම

එක්සත් රාජධානිය

එ. ජ. සං. ව්‍යා.

ඇ. එ. ජ.

ලෝක බැංකුව

අයි. ඩී. ආර්. සී.

2. සහභාගිවන ඒකක හෝ මූලස්ථාන ලෙස, සහභාගිවන ජාතීන් වශයෙන් දායක වන්නෝ.

ඉන්දියාව

පකිස්තානය

පිලිපීනය

ශ්‍රී ලංකාව

3. නිරීක්ෂකයෝ.

ආහාර හා කෘෂිකාර්මික සංවිධානය

අරමුදල් භාරකරු.

ලෝක බැංකුව

ක්‍රියාත්මක කිරීමේ ඒජන්සිය

ෆෝඩ් පදනම

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.